# ප්‍රධාන කරුණු ලේඛනය

Assetline Finance

ඇසට්ලයින් ෆිනෑන්ස් විසින් සිය පාරිභෝගිකයන් සඳහා පිරිනමනු ලබන සේවාවන් හි තොරතුරු සහ විශේෂාංග "ප්‍රධාන කරුණු ලේඛනය" ලෙසින් හැඳින්වෙන මෙම ලේඛනයේ දැක්වේ. කලින් කලට නිකුත් කරනු ලබන / සංශෝධනය කරනු ලබන ඕනෑම නියාමනයකට අනුකූලව මෙම ලේඛනයේ ඇති ඕනෑම නියමයක් / කොන්දේසියක්, ගාස්තුවක් / ගාස්තු සංශෝධනය කිරීමට, මෙම ලේඛනයෙන් ඉවත් කිරීමට සහ අලුතින් එකතු කිරීමේ අයිතිය සමාගම සතුවේ.

සියලුම බලපත්‍රලාභී මූල්‍ය සමාගම් වෙත නිකුත් කර ඇති 2018 අංක 01 දරන මූල්‍ය ව්‍යාපාර පනතේ මාර්ගෝපදේශයෙහි (මූල්‍ය ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමේ අනුකූලතා රාමුව) අවශ්‍යතාවය පරිදි මෙම ප්‍රධාන කරුණු ලේඛනය සංවර්ධනය කර ඇත.

**1. පාරිභෝගික පැමිණිලි විසඳීමේ ක්‍රියාපටිපාටිය**

ඇසට්ලයින් ෆිනෑන්ස් පාරිභෝගික පැමිණිලි විසඳීමේ කියාපටිපාටිය සඳහා කරුණාකර පහත
ලින්ක් එක බලන්න.

https://assetlinefinance.lk/storage/Key-Contact-Details-of-Person-Handling-ComplaintsSinhala.pdf

**2. අදාල නීතිමය විධිවිධාන**

සමාගම පහත සඳහන් නීති රාමුව තුළ පිරිනමනු ලබන නිෂ්පාදන සහ සේවා සම්බන්ධ අදාළ නීතිමය
විධිවිධාන වලට අනුකූල වේ.

- 2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනත
- සංශෝධිත 2000 අංක 56 දරණ මූල්‍ය කල්බදු පනත
- සංශෝධිත 1982 අංක 29 දරණ පාරිභෝගික ණය පනත
- සංශෝධිත සිවිල් නඩු විධි විධාන සංග්‍රහය
- සංශෝධිත 1949 අංක 6 දරණ උකස් පනත
- 2006 අංක 06 දරණ මූල්‍ය ගනුදෙනු කිරීමේ පනත

**3. ඇසට්ලයින් ෆිනෑන්ස් හි නිෂ්පාදන සහ සේවා ලබාගැනීමේ ක්‍රියාපටිපාටිය**

සේවාවන් ලබාගැනීමට බලාපොරොත්තු වන සියලුම ගනුදෙනුකරුවන්ට ප්‍රධාන කාර්යාලයට හෝ ළඟම ඇති ඇසට්ලයින් ෆිනෑන්ස් ශාඛාවට ගොස්, ඔවුන්ගේ අවශ්‍යතා පිළිබඳව ඇසට්ලයින් සමාගමේ නියෝජිතයන් සමඟ සාකච්ඡා කරන ලෙසට ආරාධනා කෙරේ.

එම සාකච්ඡාවෙන් අනතුරුව, සමාගම විසින් ඔවුන්ට නිෂ්පාදන හෝ සේවාවන් ලබාගැනීම සඳහා අවශ්‍ය කරන අයැදුම්පතක් නිකුත් කරනු ඇත. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයැදුම්පත ලැබුණු පසු අදාළ මූල්‍ය නිෂ්පාදන යෝග්‍ය ලෙස පිරිනැමීම සඳහා වන ඉල්ලීම සළකා බැලීම සඳහා එය ඇගයීමට ලක්කෙරෙනු ඇත.

4. නිෂ්පාදන සහ සේවා

# ලීසිං

| | |
|---|---|
| **නිෂ්පාදන සන්නාමය** | LEASING & LOAN<br>2W&3W LEASING<br>Liya Diriya |
| **ප්‍රධාන නියමයන් සහ කොන්දේසි** | පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කොට, පුද්ගලික ගනුදෙනුකරුවන්ට ලීසිං පහසුකම් සඳහා ඉල්ලුම් කළ හැකිය,<br>■ හඳුනා ගැනීමේ සාක්ෂි (ජා.හැ.ප./රි.බ./වි.ග.බ.)<br>■ පදිංචිය තහවුරු කිරීමේ සාක්ෂි (ජා.හැ.ප./ උපයෝගීතා බිල් ග්‍රා.නි. සහිතකය)<br>■ ආදායම් තහවුරු කිරීම ( වැටුප් වාර්ථා/ බැංකු ලියවිලි / වෙනත් තහවුරු කළ හැකි ලියවිලි)<br>■ වාහනයේ තොරතුරු (සැපයුම්කරු / වාහනයේ තොරතුරු / තක්සේරු වාර්ථා<br>■ ඇපකරුවන්ගේ තොරතුරු (ජා.හැ.ප. / බිල්පත් / ආදායම් තොරතුරු )<br>පහත සඳහන් ලිය කියවිලි ඉදිරිපත් කොට, ආයතනික ගනුදෙනුකරුවන්ට ලීසිං පහසුකම් සඳහා ඉල්ලුම් කළ හැකිය,<br>■ හඳුනා ගැනීමේ සාක්ෂි (ව්‍යාපාර ලියාපදිංචිය / 41 සිට හෝ 01)<br>■ ලියාපදිංචි ලිපිනයේ සාක්ෂි (13 සිට)<br>■ හෙළි කළ යුතු මූල්‍ය සාක්ෂි (මූල්‍ය ප්‍රකාශන/ බැංකු ලියවිලි තහවුරු කළ හැකි වෙනත් ලියවිලි)<br>■ ඇපකරුවන්ගේ තොරතුරු (ජා.හැ.ප./ බිල්පත් / ආදායම් තොරතුරු<br>■ වාහනයේ තොරතුරු ( සැපයුම්කරු වාහනයේ තොරතුරු / තක්සේරු වාර්ථා<br>■ අනුමත මණ්ඩල යෝජනාව / යෝජනා |
| **පොලී අනුපාතය / දඩ අනුපාතය** | ණය නිෂ්පාදනය සඳහා අදාළ වන පොලී අනුපාතය තීරණය කරනු ලබන්නේ ණය පහසුකමේ ස්වභාවය, ආපසු ගෙවන කාලය, ණය ලබාගැනීම සඳහා සේවාලාභියාට ඇති සුදුසුකම් සහ පිරිනමනු ලබන ඇපය යන කරුණු මත පදනම්ව. වෙළෙඳ පොළ තත්ත්වයන් මත පදනම්ව පොලී අනුපාතය කලින් කලට සංශෝධනය විය හැකිය.<br><br>දඩ පොලිය අදාළ වන්නේ දින හතක (07) සහන කාලයකින් අනතුරුවය. පවතින අනුපාතය වාර්ෂිකව 48% කි.<br><br>පොලී අනුපාතය සඳහා<br>https://assetlinefinance.lk/storage/afl-ir-sinhala.pdf |

| | |
|---|---|
| **ගාස්තු / කොමිස්** | ■ CRIB ගාස්තු<br>■ තැපැල් ගාස්තු<br>■ මුද්දර ගාස්තු<br>■ ආර්.එම්.වී. ගාස්තු<br>■ රක්ෂණ වාරික<br>■ පරිපාලන / ලේඛන ගාස්තු<br>ගාස්තු සඳහා<br>https://assetlinefinance.lk/storage/afl-ir-sinhala.pdf |
| **පාරිභෝගිකයන්ට ලැබෙන ප්‍රතිලාභ** | **උපරිම පහසුව**<br>■ දිවයින පුරා පිහිටි ශාඛා 61 ක ජාලය<br>■ ඊසි පේ යන්ත්‍ර, ගෙවීම් එකතු කිරීමේ මධ්‍යස්ථාන,ඊසි කෑෂ්, මහජන බැංකුව, සම්පත් බැංකුව ගෙවීමේ හැකියාව සහ සම්පත් විශ්ව, එච්.එන්.බී. වේවි අන්තජරයාල ගෙවීමේ ක්‍රම, කාර්ගීල්ස් ෆුඩ් සිටි ශාඛාවලට.<br><br>**වේගවත් හැරවුම් කාලය**<br>■ ණය පහසුකම ඉක්මනින් සූදානම් කිරීම<br>■ සුවිශේෂී සේවාවක් ලබාදීම සඳහාම කැප වූ දක්ෂ අළෙවි<br>■ කායර් මණ්ඩලය.<br><br>**සාධාරණ මිල ගණන් සහ ගාස්තු**<br>■ තරඟකාරී මිල ගණන් සහ පොළී අනුපාත<br>■ .ගිවිසුමේ වටිනාකම මත පදනම් නොවූ ස්ථාවර සේවා ගාස්තු<br>■ .දෙවැනි ණය පහසුකමට ඉල්ලුම් කිරීමේදී විශේෂ ප්‍රතිලාභ |

# රථ වාහන ණය

| | |
|---|---|
| **නිෂ්පාදන සන්නාමය** | ලීසිං & LOAN |
| **ප්‍රධාන නියමයන් සහ කොන්දේසි** | පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කොට, පුද්ගලික ගනුදෙනුකරුවන්ට ණය පහසුකම් සඳහා ඉල්ලුම් කළ හැකිය,<br>■ හඳුනා ගැනීමේ සාක්ෂි (ජා.හැ.ප./රි.බ./වි.ග.බ.)<br>■ පදිංචිය තහවුරු කිරීමේ සාක්ෂි (ජා.හැ.ප./ උපයෝගීතා බිල් ග්‍රා.නි. සහිතකය)<br>■ ආදායම් තහවුරු කිරීම ( වැටුප් වාර්ථා/ බැංකු ලියවිලි / වෙනත් තහවුරු කළ හැකි ලියවිලි)<br>■ වාහනයේ තොරතුරු (සැපයුම්කරු / වාහනයේ තොරතුරු / තක්සේරු වාර්ථා<br>■ ඇපකරුවන්ගේ තොරතුරු (ජා.හැ.ප. / බිල්පත් / ආදායම් තොරතුරු )<br>පහත සඳහන් ලිය කියවිලි ඉදිරිපත් කොට, ආයතනික ගනුදෙනුකරුවන්ට ණය පහසුකම් සඳහා ඉල්ලුම් කළ හැකිය,<br>■ හඳුනා ගැනීමේ සාක්ෂි (ව්‍යාපාර ලියාපදිංචිය / 41 සිට හෝ 01)<br>■ ලියාපදිංචි ලිපිනයේ සාක්ෂි (13 සිට)<br>■ හෙළි කළ යුතු මූල්‍ය සාක්ෂි (මූල්‍ය ප්‍රකාශන/ බැංකු ලියවිලි තහවුරු කළ හැකි වෙනත් ලියවිලි)<br>■ ඇපකරුවන්ගේ තොරතුරු (ජා.හැ.ප./ බිල්පත් / ආදායම් තොරතුරු<br>■ වාහනයේ තොරතුරු ( සැපයුම්කරු වාහනයේ තොරතුරු / තක්සේරු වාර්ථා<br>■ අනුමත මණ්ඩල යෝජනාව / යෝජනා |
| **පොලී අනුපාතය / දඩ අනුපාතය** | ණය නිෂ්පාදනය සඳහා අදාළ වන පොලී අනුපාතය තීරණය කරනු ලබන්නේ ණය පහසුකමේ ස්වභාවය, ආපහු ගෙවන කාලය, ණය ලබාගැනීම සඳහා සේවාලාභියාට ඇති සුදුසුකම් සහ පිරිනමනු ලබන ඇපය යන කරුණු මත පදනම්වය. වෙළෙඳ පොළ තත්ත්වයන් මත පදනම්ව පොලී අනුපාතය කලින් කලට සංශෝධනය විය හැකිය.<br><br>දඩ පොලිය අදාළ වන්නේ දින හතක (07) සහන කාලයකින් අනතුරුවය. පවතින අනුපාතය වාර්ෂිකව 48% කි.<br><br>පොලී අනුපාතය සඳහා<br>https://assetlinefinance.lk/storage/afl-ir-sinhala.pdf |

| | |
|---|---|
| **ගාස්තු / කොමිස්** | ■ CRIB ගාස්තු<br>■ තැපැල් ගාස්තු<br>■ මුද්දර ගාස්තු<br>■ ආර්.එම්.වී. ගාස්තු<br>■ රක්ෂණ වාරික<br>■ පරිපාලන / ලේඛන ගාස්තු<br>ගාස්තු සඳහා<br>https://assetlinefinance.lk/storage/afl-ir-sinhala.pdf |
| **පාරිභෝගිකයන්ට ලැබෙන ප්‍රතිලාභ** | **උපරිම පහසුව**<br>■ දිවයින පුරා පිහිටි ශාඛා 61 ක ජාලය<br>■ ඊසි පේ යන්ත්‍ර, ගෙවීම් එකතු කිරීමේ මධ්‍යස්ථාන,ඊසි කෑෂ්, මහජන බැංකුව, සම්පත් බැංකුව ගෙවීමේ හැකියාව සහ සම්පත් විශ්ව, එච්.එන්.බී. වේව් අන්තර්ජාල ගෙවීමේ ක්‍රම, කාර්ගිල්ස් ෆුඩ් සිටි ශාඛාවලට.<br><br>**වේගවත් හැරවුම් කාලය**<br>■ ණය පහසුකම ඉක්මනින් සූදානම් කිරීම<br>■ සුවිශේෂී සේවාවක් ලබාදීම සඳහාම කැප වූ දක්ෂ අළෙවි කායර් මණ්ඩලය.<br><br>**සාධාරණ මිල ගණන් සහ ගාස්තු**<br>■ තරඟකාරී මිල ගණන් සහ පොළී අනුපාත<br>■ .ගිවිසුමේ වටිනාකම මත පදනම් නොවූ ස්ථාවර සේවා ගාස්තු<br>■ .දෙවැනි ණය පහසුකමට ඉල්ලුම් කිරීමේදී විශේෂ ප්‍රතිලාභ |

# ඇසට් ඩ්‍රාෆ්ට්

| | |
|---|---|
| **නිෂ්පාදන සන්නාමය** | ASSET DRAFT |
| **ප්‍රධාන නියමයන් සහ කොන්දේසි** | පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කොට, පුද්ගලික ගනුදෙනුකරුවන්ට ඇසට් ඩ්‍රාෆ්ට් පහසුකම් සඳහා ඉල්ලුම් කළ හැකිය,<br>■ හඳුනා ගැනීමේ සාක්ෂි (ජා.හැ.ප./රි.බ./වි.ග.බ.)<br>■ පදිංචිය තහවුරු කිරීමේ සාක්ෂි (ජා.හැ.ප./ උපයෝගීතා බිල් ග්‍රා.නි. සහිතකය)<br>■ ආදායම් තහවුරු කිරීම ( වැටුප් වාර්ථා/ බැංකු ලියවිලි / වෙනත් තහවුරු කළ හැකි ලියවිලි)<br>■ වාහනයේ තොරතුරු (සැපයුම්කරු / වාහනයේ තොරතුරු / තක්සේරු වාර්ථා<br>■ ඇපකරුවන්ගේ තොරතුරු (ජා.හැ.ප. / බිල්පත් / ආදායම් තොරතුරු )<br>පහත සඳහන් ලිය කියවිලි ඉදිරිපත් කොට, ආයතනික ගනුදෙනුකරුවන්ට ඇසට් ඩ්‍රාෆ්ට් පහසුකම් සඳහා ඉල්ලුම් කළ හැකිය,<br>■ හඳුනා ගැනීමේ සාක්ෂි (ව්‍යාපාර ලියාපදිංචිය / 41 සිට හෝ 01)<br>■ ලියාපදිංචි ලිපිනයේ සාක්ෂි (13 සිට)<br>■ හෙළි කළ යුතු මූල්‍ය සාක්ෂි (මූල්‍ය ප්‍රකාශන/ බැංකු ලියවිලි තහවුරු කළ හැකි වෙනත් ලියවිලි)<br>■ වාහනයේ තොරතුරු ( සැපයුම්කරු වාහනයේ තොරතුරු / තක්සේරු වාර්ථා<br>■ අනුමත මණ්ඩල විභේදනය<br>පසුගිය මාස 6 ක කාලය තුළ විකුණුම් සහ කොටස් වාර්ථා විස්තර, වෙනත් ව්‍යාපාර ආධාරක ලේඛන |
| **පොලී අනුපාතය / දඩ අනුපාතය** | ඇසට් ඩ්‍රාෆ්ට් පහසුකම් සේවාලාභියාගේ ණය අවදානම මත පදනම් වූ කාල සීමාව තුළ විචල්‍ය පොලී අනුපාතයක් අය කෙරේ.<br><br>දඩ පොලිය අදාළ වන්නේ දින තුනක (03) සහන කාලයකට පසුවය. පවතින අනුපාත වාෂර්යකට 48% කි.<br><br>පොලී අනුපාතය සඳහා<br>https://assetlinefinance.lk/storage/afl-ir-sinhala.pdf |

| | |
|---|---|
| **ගාස්තු / කොමිස්** | ▪ CRIB ගාස්තු<br>▪ තැපැල් ගාස්තු<br>▪ මුද්දර ගාස්තු<br>▪ ආර්.එම්.වී. ගාස්තු<br>▪ රක්ෂණ වාරික<br>▪ පරිපාලන / ලේඛන ගාස්තු<br>ගාස්තු සඳහා<br>https://assetlinefinance.lk/storage/afl-ir-sinhala.pdf |
| **පාරිභෝගිකයන්ට ලැබෙන ප්‍රතිලාභ** | **උපරිම පහසුව**<br>▪ දිවයින පුරා පිහිටි ශාඛා 61 ක ජාලය<br>▪ ඊසි පේ යන්ත්‍ර, ගෙවීම් එකතු කිරීමේ මධ්‍යස්ථාන,ඊසි කෑෂ්, මහජන බැංකුව, සම්පත් බැංකුව ගෙවීමේ හැකියාව සහ සම්පත් විශ්ව, එච්.එන්.බී. වේවි අන්තර්ජාල ගෙවීමේ ක්‍රම, කාර්ගිල්ස් ෆුඩ් සිටි ශාඛාවලට.<br><br>**වේගවත් හැරවුම් කාලය**<br>▪ ණය පහසුකම ඉක්මනින් සූදානම් කිරීම<br>▪ සුවිශේෂී සේවාවක් ලබාදීම සඳහාම කැප වූ දක්ෂ අළෙවි කායර් මණ්ඩලය.<br><br>**සාධාරණ මිල ගණන් සහ ගාස්තු**<br>▪ තරඟකාරී මිල ගණන් සහ පොළී අනුපාත<br>▪ .ගිවිසුමේ වටිනාකම මත පදනම් නොවූ ස්ථාවර සේවා ගාස්තු<br>▪ .දෙවැනි ණය පහසුකමට ඉල්ලුම් කිරීමේදී විශේෂ ප්‍රතිලාභ |

# ව්‍යාපාර ණය

| | |
|---|---|
| **ප්‍රධාන නියමයන් සහ කොන්දේසි** | පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කොට, පුද්ගලික ගනුදෙනුකරුවන්ට ණය පහසුකම් සඳහා ඉල්ලුම් කළ හැකිය,<br>■ හඳුනා ගැනීමේ සාක්ෂි (ජා.හැ.ප./රි.බ./වි.ග.බ.)<br>■ පදිංචිය තහවුරු කිරීමේ සාක්ෂි (ජා.හැ.ප./ උපයෝගිතා බිල් ග්‍රා.නි. සහිතකය)<br>■ ආදායම් තහවුරු කිරීම ( වැටුප් වාර්ථා/ බැංකු ලියවිලි / වෙනත් තහවුරු කළ හැකි ලියවිලි)<br>■ වාහනයේ තොරතුරු (සැපයුම්කරු / වාහනයේ තොරතුරු / තක්සේරු වාර්ථා<br>■ ඇපකර / ආරක්ෂාව පිළිබඳ සාක්ෂි (දේපොළ / වාහනය)<br>■ ඇපකරුවන්ගේ තොරතුරු (ජා.හැ.ප. / බිල්පත් / ආදායම් තොරතුරු )<br>පහත සඳහන් ලිය කියවිලි ඉදිරිපත් කොට, ආයතනික ගනුදෙනුකරුවන්ට ණය පහසුකම් සඳහා ඉල්ලුම් කළ හැකිය,<br>■ හඳුනා ගැනීමේ සාක්ෂි (ව්‍යාපාර ලියාපදිංචිය / 41 සිට හෝ 01)<br>■ ලියාපදිංචි ලිපිනයේ සාක්ෂි (13 සිට)<br>■ හෙළි කළ යුතු මූල්‍ය සාක්ෂි (මූල්‍ය ප්‍රකාශන/ බැංකු ලියවිලි තහවුරු කළ හැකි වෙනත් ලියවිලි)<br>■ වාහනයේ තොරතුරු ( සැපයුම්කරු වාහනයේ තොරතුරු / තක්සේරු වාර්ථා<br>■ ඇපකර / ආරක්ෂාව පිළිබඳ සාක්ෂි (දේපොළ / වාහනය)<br>■ ඇපකරුවන්ගේ තොරතුරු (ජා.හැ.ප. / බිල්පත් / ආදායම් තොරතුරු) |
| **පොලී අනුපාතය / දඩ අනුපාතය** | සියලුම ණය පහසුකම් සඳහා ඉතා තරඟකාරී පොලී අනුපාත අදාළ වන අතර, එය එක් එක් සේවාදායකයාගේ ශ්‍රේණිගත කිරීම මත පදනම් වෙයි. ( ශ්‍රේණිගත නොකළ සියලුම ගණු දෙනුකරුවන් සඳහා ඉතා ශක්තිමත් අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ක්‍රියාවලියක් හඳුන්වා දී ඇත).<br><br>පොලී අනුපාතද බාහිර වෙළෙඳපොළ තත්ත්වයන් මත පදනම්ව ඇති අතර, එය අදාළ පරිදි කලින් කලට සංශෝධනය කරනු ඇත.<br><br>පොලී අනුපාතය සඳහා<br>https://assetlinefinance.lk/storage/afl-ir-sinhala.pdf |

| | |
|---|---|
| **ගාස්තු / කොමිස්** | ■ CRIB ගාස්තු<br>■ උකස් බැඳුම්කර ගාස්තු / නීති ගාස්තු, අදාළවේ නම්.<br>■ තැපැල් ගාස්තු සහ මුද්දර ගාස්තු<br>■ රක්ෂණ/ ණය ආරක්ෂණ ආවරණය, අදාළ වේ නම්.<br>■ ණය පහසුකම සැකසීමේ ගාස්තුව<br><br>ගාස්තු සඳහා<br>https://assetlinefinance.lk/storage/afl-ir-sinhala.pdf |
| **පාරිභෝගිකයන්ට ලැබෙන ප්‍රතිලාභ** | **උපරිම පහසුව**<br>■ දිවයින පුරා පිහිටි ශාඛා 61 ක ජාලය<br>■ ඊසි පේ යන්ත්‍ර, ගෙවීම් එකතු කිරීමේ මධ්‍යස්ථාන,ඊසි කෑෂ්, මහජන බැංකුව, සම්පත් බැංකුව ගෙවීමේ හැකියාව සහ සම්පත් විශ්ව, එච්.එන්.බී. වේව් අන්තර්ජාල ගෙවීමේ ක්‍රම, කාර්ගිල්ස් ෆුඩ් සිටි ශාඛාවලට.<br><br>**වේගවත් හැරවුම් කාලය**<br>■ ණය පහසුකම ඉක්මනින් සූදානම් කිරීම<br>■ සුවිශේෂී සේවාවක් ලබාදීම සඳහාම කැප වූ දක්ෂ අළෙවි කායර් මණ්ඩලය.<br><br>**සාධාරණ මිල ගණන් සහ ගාස්තු**<br>■ තරඟකාරී මිල ගණන් සහ පොළී අනුපාත |

# ආන්තික වෙළඳාම

| | |
|---|---|
| **ප්‍රධාන නියමයන් සහ කොන්දේසි** | යෝග්‍යතාව<br>■ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම (අවම වශයෙන් වයස අවුරුදු 18 ක්<br>■ විය යුතුය)<br>■ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් හෝ සංස්ථාවක් විය යුතුය.<br>■ මුදල් අමාත්‍යංශය විසින් අනුමත කළ ඕනෑම අරමුදලක්<br>■ SEC සහ අනෙකුත් නියාමන ආයතන විසින් කිසිදිනෙක බංකොලොත් බවට ප්‍රකාශ කර නොමැතිද, කළු ලැයිස්තුගත කර නොමැතිද වූ පුද්ගලයෙකු හෝ සමාගමක්.<br><br>ඉහත සඳහන් සාධක මත පදනම්ව සේවාදායකයාට ඉහළ ආන්තික සීමාවක් පිරිනැමිය හැකි වුවත්, ගනුදෙනුකරුගේ පාවෙන සීමාව සෑම විටම වෙළඳාම් කළ හැකි කොටස්වල පිළිගත හැකි වටිනාකමෙන් 50% ක් වේ.<br><br>උපුටා නොගත් සුරැකුම්පත් ගැණුම්කරුගේම සමාගම් හෝ කොටස් මිලදී ගැනීමට හෝ ණය කොටස්වල ගනු දෙනු කිරීමට ඇසට්ලයින් සමාගම මුදල් අත්තිකාරම් ලබා නොදෙයි. |
| **පොලී අනුපාතය / දඩ අනුපාතය** | ප්‍රාග්ධනය වන හිඟ ශේෂය මත පදනම්ව, එකඟ වූ පොලී මුදලක් සෑම මසකදීම ණය ගැනුම්කරුගෙන් අය කෙරෙනු ඇත.<br><br>පොලී අනුපාතය සඳහා<br>https://assetlinefinance.lk/storage/afl-ir-sinhala.pdf |
| **ගාස්තු / කොමිස්** | ■ රු. මිලියන 5ක් දක්වා සීමාව අදාළව රු. 3,500 හෝ ඊට අඩු මුදලක් වේ.<br>■ රු. මිලියන 5 ට වඩා වැඩිනම් ගාස්තු අය නොකෙරේ<br>■ ගනුදෙනුකරු පහසුකම සඳහා ලියාපදිංචි කිරීමේ අවස්ථාවේදී, අදාළ නියමයන් හා කොන්දේසිවලට අනුකූලව, එක් වරක් පමණක් මාර්ජින් වෙළඳාම් ගාස්තුවක් අය කරනු ලැබේ. |
| **පාරිභෝගිකයන්ට ලැබෙන ප්‍රතිලාභ** | ණය ගැණුම්කරුට සාමාන්‍යයෙන් ඔහුගේ / ඇයගේ සම්පත් යොදාගෙන මිලට ගත හැකි කොටස් ප්‍රමාණයට වඩා වැඩි කොටස් ප්‍රමාණයක් මිලට ගැනීමට මෙම පහසුකමෙන් හැකියාවක් ලැබෙයි.<br><br>දැනට ඇති කොටස් විකිණීමෙන් හෝ පාරිභෝගිකයාගේම අරමුදල් වලින් අමතර ප්‍රාග්ධන ආයෝජනයක් නොකර, නව සුරැකුම්පත්වල ආයෝජනය කිරීමට මින් හැකියාවක් ලැබෙයි.<br><br>ඕනෑම ලියාපදිංචි තැරැව්කරුවෙකු හරහා පහසුකම සපයනු ලැබේ. |

## ග්‍රීන් ලෝන්

| | |
|---|---|
| **නිෂ්පාදන සන්නාමය** | GREEN LOAN |
| **ප්‍රධාන නියමයන් සහ කොන්දේසි** | පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කොට, පුද්ගලික ගනුදෙනුකරුවන්ට පහසුකම සඳහා ඉල්ලුම් කළ හැකිය,<br>■ හඳුනා ගැනීමේ සාක්ෂි (ජා.හැ.ප./රි.බ./වි.ග.බ.)<br>■ පදිංචිය තහවුරු කිරීමේ සාක්ෂි (ජා.හැ.ප./ උපයෝගීතා බිල් ග්‍රා.නි. සහිතකය)<br>■ ආදායම් තහවුරු කිරීම ( වැටුප් වාර්ථා/ බැංකු ලියවිලි / වෙනත් තහවුරු කළ හැකි ලියවිලි)<br>■ ඇපකරුවන්ගේ තොරතුරු (ජා.හැ.ප. / බිල්පත් / ආදායම් තොරතුරු )<br>■ අනෙකුත් ඇප ලියවිලි<br><br>පහත සඳහන් ලිය කියවිලි ඉදිරිපත් කොට, ආයතනික ගනුදෙනුකරුවන්ට ණය පහසුකම් සඳහා ඉල්ලුම් කළ හැකිය,<br><br>■ හඳුනා ගැනීමේ සාක්ෂි (ව්‍යාපාර ලියාපදිංචිය / 41 සිට හෝ 01)<br>■ ලියාපදිංචි ලිපිනයේ සාක්ෂි (ඔප්පු පිටපත / උපයෝගිතා බිල් මාස 06)<br>■ හෙළි කළ යුතු මූල්‍ය සාක්ෂි (මූල්‍ය ප්‍රකාශන / බැංකු ලියවිලි/තහවුරු කළ හැකි වෙනත් ලියවිලි )<br>■ අපකරුවන්ගේ තොරතුරු<br>■ අනුමත මණ්ඩල යෝජනා |
| **පොලී අනුපාතය / දඩ අනුපාතය** | පොලී අනුපාතය / දඩ පොලී අනුපාතිකය සාමාන්‍ය ප්‍රමුඛ ණය දීමේ අනුපාතයට යොමු කරමින් මාසික පදනමින් තීරණය කෙරේ.<br><br>පොලී අනුපාතය සඳහා<br>https://assetlinefinance.lk/storage/afl-ir-sinhala.pdf |

| | |
|---|---|
| **ගාස්තු / කොමිස්** | ■ CRIB ගාස්තු<br>■ තැපැල් ගාස්තු<br>■ මුද්දර ගාස්තු<br>■ ආර්.එම්.වී. ගාස්තු<br>■ රක්ෂණ වාරික<br>■ DTA ආවරණ<br>■ පරිපාලන / ලේඛන ගාස්තු<br>ගාස්තු සඳහා<br>https://assetlinefinance.lk/storage/afl-ir-sinhala.pdf |
| **පාරිභෝගිකයන්ට ලැබෙන ප්‍රතිලාභ** | **උපරිම පහසුව**<br>■ දිවයින පුරා පිහිටි ශාඛා 61 ක ජාලය<br>■ ඊසි පේ යන්ත්‍ර, ගෙවීම් එකතු කිරීමේ මධ්‍යස්ථාන,ඊසි කෑෂ්, මහජන බැංකුව, සම්පත් බැංකුව ගෙවීමේ හැකියාව සහ සම්පත් විශ්ව, එච්.එන්.බී. වේවි අන්තර්ජාල ගෙවීමේ ක්‍රම, කාර්ගිල්ස් ෆුඩ් සිටි ශාඛාවලට.<br><br>**වේගවත් හැරවුම් කාලය**<br>■ ණය පහසුකම ඉක්මනින් සූදානම් කිරීම<br>■ සුවිශේෂී සේවාවක් ලබාදීම සඳහාම කැප වූ දක්ෂ අළෙවි කායර් මණ්ඩලය.<br><br>**සාධාරණ මිල ගණන් සහ ගාස්තු**<br>■ තරඟකාරී මිල ගණන් සහ පොළී අනුපාත<br>■ .ගිවිසුමේ වටිනාකම මත පදනම් නොවූ ස්ථාවර සේවා ගාස්තු<br>■ .දෙවැනි ණය පහසුකමට ඉල්ලුම් කිරීමේදී විශේෂ ප්‍රතිලාභ |

# ස්ථාවර තැන්පතු

| | |
|---|---|
| **ගිණුමක් විවෘත කිරීමේ ක්‍රියාපටිපාටිය** | **තනිපුද්ගල**<br>▪ අවශ්‍ය නිසි පාරිභෝගික තොරතුරු (CDD) සමඟ ස්ථාවර තැන්පතු විධානය සම්පූර්ණ කිරීම සහ අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීම<br>▪ වලංගු ජාතික හැඳුනුම්පතක පිටපතක් ඉදිරිපත් කිරීම, ජාතික හැඳුනුම්පත නොමැති විට, ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් රියැදුරු බලපත්‍රය / විදෙස් ගමන් බල පත්‍රය.<br>▪ පදිංචි ලිපිනය, ජාතික හැඳුනුම්පතේ හෝ රියැදුරු බලපත්‍රයේ ලිපිනයෙන් වෙනස් වෙයි නම්, ලිපිනය තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.<br>▪ නාමිකයාගේ තහවුරු කිරීම සඳහා අවශ්‍ය ලේඛන (අවශ්‍ය වුවහොත්)<br>**සංස්ථා සහ වෙනත් ආයතන**<br>▪ ස්ථාවර තැන්පතු අයදුම්පත සම්පූර්ණ කිරීම<br>▪ අවශ්‍ය නිසි පාරිභෝගික තොරතුරු අවශ්‍යතා (කකඩී) සම්පූර්ණ කිරීම සහ අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කරන්න.<br>▪ ව්‍යාපාර ලියාපදිංචිය / සංස්ථාපිත සහතිකය / ලියාපදිංචි පනතේ පිටපත / සමාගම් ව්‍යවස්ථාවලිය, මණ්ඩල යෝජනාව, ප්‍රතිලාභ හිමිකම ප්‍රකාශ කිරීම, අධ්‍යක්ෂවරුන්ගේ දත්ත එකතු කිරීමේ ආකෘති / බලයලත් අත්සන් ලිපිය, බලයලත් අත්සන්කරුවන්ගේ හඳුනා ගැනීමේ ලේඛනය, බලයලත් අත්සන් ලිපිය, ආකෘති පත්‍රය 20.<br>▪ ලිපිනය තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්කි ඉදිරිපත් කරන්න. (උපයෝගීතා බිල් හෝ සමාගමේ නමට ඇති බැංකු විස්තරයක්). |
| **අවම මූලික තැන්පත් මුදල** | ▪ රු. 100,000.00 |
| **අදාළ ගාස්තු** | ▪ ආරම්භක ගාස්තු නැත.<br>▪ බැංකු ඇපකර සඳහා සහතික කළ වටිනාකමින් 1.5%ක් අය කෙරේ. (කොමිස් ගාස්තු මත රජයේ බද්ද අදාළ වේ)<br>▪ තැන්පතුවට එරෙහි ණය සඳහා පොලී අනුපාතය, තැන්පතු පොලී අනුපාතයට වඩා 3%කින් වැඩි වේ. |
| **ගිණුමක් විවෘත කිරීම/ගිණුමක් වසා දැමීම /ගනුදෙනුකරුවන් විසින් අරමුදල් මාරු කිරීම පිළිබඳ ප්‍රධාන නියමයන් සහ කොන්දේසි** | ගාස්තු සඳහා<br>https://assetlinefinance.lk/storage/afl-ir-sinhala.pdf<br>▪ වයස අවුරුදු 18 ට වැඩි ශ්‍රී ලාංකික නේවාසිකයෙකුට ස්ථාවර |

| | |
|---|---|
| | ■ වයස අවුරුදු 18 ට වැඩි ශ්‍රී ලාංකික නේවාසිකයෙකුට ස්ථාවර තැන්පතු ගිණුම් විවෘත කිරීමට අවසර ඇත. කෙසේ වෙතත්, භාරකරුවෙකු හවුල් තැන්පත් කරුවෙකු ලෙසින් සළකමින් බාල වයස්කාර ස්ථාවර තැන්පතු ද පිළිගනු ලැබේ.<br>■ තැන්පතු හිමියාගේ වයස අවුරුදු 18 ට අඩු නම්, බාල වයස්කාර ගිණුම් හිමියාට නිසි වයස් පිරෙන තෙක් තැන්පතු මුදල් ආපසු ලබාගත නොහැක.<br>■ තැන්පත්කරු විදේශගතව සිටින්නේ නම්, ස්ථාවර තැන්පතුව සම්බන්ධයෙන් ලබා දී ඇති මූලික උපදෙස් වල කිසියම් වෙනසක් සිදු කිරීම සඳහා ඇටෝර්නි බලපත්‍රයක් අනිවාර්ය වේ.<br>■ ජාතික හැඳුනුම්පත් අංකය සහිත හැඳුනුම්පතක් (ජාතික හැඳුනුම්පත /රියැදුරු බලපත්‍රය / විදේස් ගමන් බලපත්‍රය) නොමැති ශ්‍රී ලාංකිකයන්ට ස්ථාවර තැන්පතුවක් ආරම්භ කළ නොහැක.<br>■ ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීමට නේවාසික වීසා අවසර පතක් නොමැති විදේශිකයන්ට ස්ථාවර තැන්පතුවක් ආරම්භ කළ නොහැක.<br>■ ස්ථාවර තැන්පතුවක් ආරම්භ කළ හැක්කේ ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි ඒකාබද්ධ සහ අනෙකුත් ආයතනවලට පමණි.<br>■ පොළිය ගෙවනු ලබන්නේ කල් පිරීමේදී පමණකි.<br>■ කල් පිරීමට පෙර මුදල් ආපසු ගැනීමේදී පොළිය ගෙවනු ලබන්නේ කළමනාකාරීත්වයේ අභිමතය පරිදිය.<br>■ තැන්පතු හිමියාට කල් පිරීමට පෙර ස්ථාවර තැන්පතුවක මුදල් ආපසු ගැනීමට අවශ්‍ය නම්, සහ එම මුදල් ආපසු ලබාගන්නා දිනය දක්වා පාරිභෝගිකයාට මාසික පදනමින් පොලී ගෙවා ඇත්නම්, කල් පිරීමට පෙර මුදල් ආපසු ගැනීමේදී වැඩිපුර ගෙවා ඇති පොලී මුදල මූලික තැන්පතු මුදලින් අඩු කරනු ලැබේ.<br>■ ස්ථාවර තැන්පතුව තැන්පත් කිරීමෙන් දින 30 කට පෙර මුදල් ආපසු ලබා ගන්නේ නම් (තැන්පත් කළ දිනය ඇතුළුව සහ ආපසු ගත් දිනය හැර) කිසිදු පොළියක් ගෙවනු නොලැබේ.<br>■ තැන්පතු සහතික අස්ථානගත වූ අවස්ථාවක දී, ඒ සම්බන්ධයෙන් තැන්පත් කරුගෙන් පිළිගත හැකි පැහැදිලි කිරීමක් සහ දිවුරුම් ප්‍රකාශයක් ලබාගැනීමෙන් අනතුරුව අලුත් සහතිකයක් නිකුත්කරනු ලැබේ. |
| **මූල්‍ය සහ වෙනත් ප්‍රතිලාභ** | ■ මාස 03 සිට මාස 60 දක්වා කාලසීමාවක් මත පොලී අනුපාත පදනම් වෙයි.<br>■ කල්පිරීමේ තැන්පතු සඳහා 100% දක්වා සහ මාසික තැන්පතු සඳහා ඔබේ ආයෝජනයෙන් 85% දක්වා ඇපකර නිකුත් කරනු ලැබේ.<br>■ තැන්පත්කරුවෙකුට රුපියල් 1,100,000/- උපරිමයක් දක්වා වන්දි ගෙවීම සඳහා, සුදුසු කර්ම ලත් තැන්පතු වගකීම් මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ රක්ෂණය කෙරේ.<br>■ පාරිභෝගිකයාට, කාලීන තැන්පතුවේ පරිපූර්ණ වටිනාකමෙන් උපරිම 85%ක් දක්වාත්, මාසික තැන්පතුවේ වටිනාකමෙන් උපරිම 80%ක් දක්වාත් තැන්පතුවට එරෙහිව ණයක් ලබාගත හැක. |